# අකුරැස්ස ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

---

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 21 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ උපකල්පන පිළිබඳ සටහන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයට අනුව සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 28 ක වටිනාකම් තක්සේරු කර සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ පත්‍රයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම යටතේ දක්වා නොතිබුණි.

(ආ) රු.6,390,000 ක් වටිනා ඩබල් කැබ් රථය සභාවට 2014 දෙසැම්බර් 09 දින ලැබී තිබුණ අතර එම වත්කම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් දරන ලද රු.159,718 ක ප්‍රාග්ධන වියදම් පුනරාවර්ථන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සභාවට මධ්‍යම පරිසර අධිකාරියෙන් හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් වාහන 04 ක් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණි. එකී වාහනවල පිරිවැය වටිනාකම රු.6,199,000 ක් වුවද මෝටර් රථ හා කරත්ත යටතේ ප්‍රාග්ධනිත කර ඇති මුදල රු.6,975,000 ක් වූයෙන් වැඩියෙන් ගිණුම් ගතවී තිබූ මුදල රු.776,000 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මිලට ගන්නා ලද රු.209,500 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් දෙකක් ප්‍රාග්ධනීන කර නොතිබුණි.

(ඊ) 2014 ජනවාරි 01 දිනට ප්‍රධාන ලෙජරය අනුව ප්‍රතිපාදිත මුද්දර ගාස්තු ණයගැති වටිනාකම රු.5,284,240 ක් වුවද වර්ෂය තුල රු.7,336,840 ක් ලැබී තිබුණි. ඒ අනුව වැඩිපුර ලැබී තිබූ

රු.2,052,600 ක මුදල සඳහා ණයගැති ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති වටිනාකම එම ප්‍රමාණයට අඩුවී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති ප්‍රාග්ධන ආධාර රු.2,853,690 ක මුදලක් ප්‍රාග්ධන ආධාර අය ශීර්ෂයට බැර කළයුතු වුවද ප්‍රාග්ධන ආධාර ණයගැති ගිණුමට බැර කර තිබුණි.

(ඌ) දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සභික දීමනා ප්‍රතිපූර්ණය කිරීමේදී සභාවේ සභිකයින් සඳහා ණය පදනම මත ලබාදී ඇති යතුරු පැදි සඳහා අදාල වාරික මුදල් ලෙස රු.408,650 ක මුදලක් ආපසු අයකරගෙන තිබුණ අතර එකී මුදල ආදායම් ආධාර යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් දීමනා සඳහා ගෙවන ලද රු.135,750 ක මුදලක් අදාල වැය විෂයට හර නොකර 105(9) (ii) දරන වෙනත් සේවාවන් සඳහා රජයේ දෙපාර්තමේන්තුවලට ගෙවීම් වැය විෂයට හර කර තිබුණි.

(ඒ) ප්‍රධාන ලෙජරයේ පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් ගිණුම (වැය විෂය 506) අනුව සමාලෝචිත වර්ෂයට අදාල වියදම් ලෙස රු.1,277,460 ක් ආදායම් හා වියදම් ගිණුමට මාරු කර තිබුණද ගිණුම්ගත කර තිබුනේ රු.1,244,460 ක් පමණක් වූයෙන් අඩුවෙන් ගිණුම්ගත වී තිබූ මුදල රු.33,000 ක් විය.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ජල කර්මාන්ත ගබඩා තොගය රු.158,857 ක් වුවද ඉදිරිපත් කර ඇති තොග උපලේඛනය අනුව වටිනාකම රු.182,220 ක් වූයෙන් අඩුවෙන් ගිණුම් ගතවී තිබූ මුදල රු.23,363 ක් විය.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් අටකට අදාලව ඉදිරිපත් කර ඇති ප්‍රධාන ලෙජර පාලන ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.68,666,141 ක් වූ අතර උපලේඛන අනුව එකතු ශේෂයන්ගේ වටිනාකම රු.62,555,479 ක් වූයෙන් වෙනස රු.6,110,662 ක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.7,824,337 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.2,054,760 ක් විය

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.117,782,741 ක් වටිනා ගිණුම් විෂයයන් 09 කට අදාල ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය, යන්ත්‍රෝපකරණ ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, යාවත්කාලීනව හා විධිමත්ව පවත්වාගනු ලැබූ වාහන ලේඛනය, ඉන්වෙන්ට්‍රි ලේඛනය, ණයහිමි උප ලේඛන හා කාල විශ්ලේෂණ වාර්තා, ආයෝජන ලේඛනය, කේවල ණය ශේෂ දැක්වෙන පරිදි උපලේඛන යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,282,636 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,683,321 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් | 3,705 | 3,668 | 1,239 |
| කුලී | 5,860 | 5,399 | 4,639 |
| වෙනත් ආදායම් හා ආධාර | 45,538 | 107,182 | 63,192 |

2.2.2 වරිපනම් බදු

(අ) 2014 වර්ෂය සඳහා වරිපනම් බදු බිල් කිරීම් අධි ගාස්තු සමඟ රු.2,349,356 ක් වූ අතර එකී මුදලින් වර්ෂය තුල ලැබීම් රු.1,857,681 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් බදු අයවීමේ ප්‍රගතිය සියයට 79 කි. 2014 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,489,019 ක් වූ අතර, එකී හිඟ මුදලින් අය වූ මුදල රු.784,100 කි. ඒ අනුව හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 52 ක් විය.

(ආ) ප්‍රාදේශීය සභාවට අයකර ගත යුතු වරිපනම් හා අක්කර බදු නියමිත කාල සීමාව තුල නොගෙවන්නේ නම් 1987අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තියේ (i) (ii) විධිවිධාන අනුව එකී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා ලැබිය යුතු රු.1,396,319 ක් වූ ආදායම් හිඟව තිබුණි.

2.2.3 අක්කර බදු

සමාලෝචිත වර්ෂයට අදාල අක්කර බදු බිල් කිරීම් නොමැති අතර 2014 ජනවාරි 01 දිනට හිඟ ශේෂය රු.45,304 ක් විය. වර්ෂය තුල හිඟ අයවීම් රු.11,704 කි. ඒ අනුව හිඟ බදු අයවීමේ ප්‍රගතිය සියයට 25 ක් විය.

2.2.4 බදු කුලී

(i) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබූ කඩ බදු මුදල රු.4,565,987 ක් වූ අතර, එකී මුදල තුල ඉකුත් වර්ෂ සඳහා ලැබිය යුතු රු.3,303,591 ක් විය. ඒ අනුව එකී හිඟ ආදායමෙන් සියයට 72 ක් ඉකුත් වර්ෂවලට අදාල විය.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබූ බිම්බදු මුදල රු.551,096 ක් වූ අතර එකී මුදල තුල ඉකුත් වර්ෂවලට අදාල හිඟහිටි මුදල රු.492,375 ක් වූයෙන් එකී අගය බිම්බදු හිඟ ශේෂයෙන් සියයට 89 ක් විය.

2.2.5 ජල ගාස්තු
-------------
සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු රු.100,763 ක් විය. මෙම හිඟ ශේෂය තුල ඉකුත් වර්ෂවලට අදාල හිඟමුදල රු.16,639 ක් වූ අතර එම මුදල හිඟ ශේෂයෙන් සියයට 16 ක් විය.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 677,847 |
| (ii) | මුද්දර ගාස්තු | 1,391,243 |

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------
3.1 කාර්ය සාධන ඇගයීම
---------------------------
3.1.1 සභාවට අයත් මංමාවත් පරිපාලනය
----------------------------------------
මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සම්මත කරගෙන ඇති අයවැය ලේඛනයෙහි සභාවට අයත් මංමාවත් ප්‍රමාණය, දිග, පළල සහ සභාව විසින් නඩත්තු කළයුතු බෝක්කු හා පාලම් ප්‍රමාණය සම්බන්ධයෙන් විස්තර සඳහන් කර නොතිබුණි.

(ආ) 1987 අක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය පරිදි සභා බල ප්‍රදේශයේ ඇති සභාවට අයත් මාර්ග ගැසට් පත්‍රයේ පල කරවා ප්‍රසිද්ධ කළයුතු වුවද 2005 වර්ෂයෙන් පසුව සභාව හඳුනාගත් නව මංමාවත් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ ඇති සභාවට අයත් මංමාවත් සම්බන්ධයෙන් එක් එක් මාර්ගයේ දිග, පළල, ආරම්භක ස්ථානය හා අවසන් වන ස්ථානය, තාර, කොන්ක්‍රීට්, බොරළු යනාදී ලෙසට මාර්ගයේ ස්වභාවයද, වීථි රේඛා යනාදී තොරතුරුද සඳහන් කරමින් මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------
3.2.1 අතිකාල දීමනා ගෙවීම්
--------------------------
සභාවේ නිලධාරීන් හා සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.990,960 ක මුදලක් අතිකාල දීමනා සඳහා ගෙවීම් කර තිබුණි.

අතිකාල අනුමත කිරීමේදී ආයතන සංග්‍රහයේ X වන පරිශිෂ්ඨයේ 3 වන වගන්තිය පරිදි සැම මාසයකම අතිකාල සීමාව, අනුමත අතිකාල පැය ගණන, සම්පූර්ණ කළයුතු වැඩ සහ ඒකක පිළිබඳ විස්තර සහ අතිකාල සේවා කාලය තුල ඉටුකළ වැඩ විස්තර යනාදියද අතිකාල දීමනා ගෙවීම් වවුචර සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

3.2.2 සේවක ණය

සමාලෝචිත වර්ෂය අවසානයට, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා සේවයෙන් පහකරන ලද සේවකයින් දොලොස් දෙනෙකුගෙන් රු.56,391 ක මුදලක් අයවීමට තිබුණි.

3.2.3 ජල ව්‍යාපෘතිය ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරාදීම

2010 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ජල ව්‍යාපෘතිය භාරදීමේදී ජල පාරිභෝගිකයින්ගෙන් රු.100,763 ක මුදලක් හිඟහිට තිබූ අතර ජල තැන්පතු ගිණුමේ රු.825,920 ක ශේෂයක් නිරවුල් නොකර පවතින බව නිරීක්ෂණය විය.

3.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂය අවසානයට දීර්ඝ කාලයක සිට විදුලි ගිණුමේ අක්‍රියව පවතින රු.61,882 ක් වූ මුදලක් නිරවුල් කර නොතිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| තෘතියික | 01 | 01 | - | - |
| ද්විතියික | 30 | 27 | 03 | - |
| ප්‍රාථමික | 47 | 34 | 13 | - |
| වෙනත් | - | 10 | - | 10 |
| | 78 | 72 | 16 | 10 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.18,556,966 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් හා සභික දීමනා ලෙස රු.22,800,632 ක් වැයකර තිබුණෙන් රු.4,243,666 ක මුදලක් සභා අරමුදලට වැයබරක් වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් සභාවේ අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කටයුතු සඳහා වෙනම අංශයක් සභාවේ ක්‍රියාත්මක වී නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලනය

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ගබඩා පරිපාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය